# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 දෙසැම්බර් මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2022.12.23 දින නිකුත් කරන ලදී)**

## සමථ මණ්ඩල (සංශෝධන)

**1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ වගන්තියේ විෂය පථය පුළුල් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඉල්ලීම් භාර ගැනීමේ කාර්ය පටිපාටිය, නඩු වෙනත් අධිකරණයක් වෙත යොමු කිරීම සහ ඊට අදාළ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 6 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සමථ මණ්ඩලය විසින්, 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනත යටතේ ඇති ආරාවුලක් සම්බන්ධයෙන් වන යම් ඉල්ලීමක් එකී පනත යටතේ පත් කරන ලද සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමු කරනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) නිරවුල් කිරීමක් කළ නොහැකි අවස්ථාවක දී, නිරවුල් නොකිරීමේ සහතිකයක් ආරාවුල්කරුවන් වෙත නිකුත් කිරීමට; සහ

(ආ) යම් අධිකරණයක් විසින් යොමු කරන ලද ආරාවුලක් සම්බන්ධයෙන් වන විට, ආරාවුල සමථ කිරීමෙන් නිරවුල් කිරීමට නොහැකි වූ බව සඳහන් කරමින් අධිකරණය වෙත වාර්තාවක් නිකුත් කිරීමට,

සභාපතිවරයාට හෝ ප්‍රධාන සමථකාරවරයාට බලය පැවරීම වේ.

# සමථ මණ්ඩල (සංශෝධන)

එල්.ඩී.—ඕ. 78/2021

**1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක   දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1988 අංක 72 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"කොමිෂන් සභාව පත් කිරීම

2. (1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් පස්දෙනකුගෙන් සමන්විත කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තන්ගෙන් දෙදෙනකු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයේ විනිශ්චයකාර ධුර දැරූ තැනැත්තන් අතුරින් විය යුතු අතර ඒ තැනැත්තන්ගෙන් තිදෙනකු-

(අ) නීතිඥවරයන් වශයෙන් අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් ඇති;

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීප ව්‍යාප්ත සේවයක 1 වන පන්තියේ තනතුරු දරනු ලැබූ;

(ඇ) රාජ්‍ය සේවයේ විශ්‍රාමික මාණ්ඩලික නිලධරයන්; හෝ

(ඈ) සමථකරණයේ හෝ වෙනත් යම් විකල්ප ආරාවුල් විසඳීමේ ක්‍රියාවලියේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සතු පුද්ගලික අංශයේ කළමනාකරණ මට්ටමේ ධුර දරනු ලැබූ,

තැනැත්තන් අතුරින් විය යුතු යඃ

එසේ වුවද, කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීමේ දී කොමිෂන් සභාවේ සාමාජිකත්වය මගින් ශ්‍රී ලාංකික සමාජයේ බහුත්ව ස්වභාවය නිරූපණය වන බවට ජනාධිපතිවරයා විසින් වගබලාගත යුතු ය.

(2) පත් කරනු ලබන දිනය වන විට වයස අවුරුදු හැත්තෑවට එළඹි කිසිදු තැනැත්තකු කොමිෂන් සභාවට පත් කරනු නොලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් සාමාජිකයන්ගෙන් එක් අයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුතු ය.

(4) සභාපතිවරයා සහ කොමසාරිස්වරුන් ඔවුන්ගෙන් යම් අයකු කලින් මරණයට පත් වුවහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු යඃ

එසේ වුව ද, සභාපතිවරයාගේ හෝ කොමසාරිස්වරුන්ගේ ධුර කාලය අවසන් වීමෙන් පසු කොමිෂන් සභාවේ අලුත් සාමාජිකයන් පත් කරනු ලැබ නොමැති නම් එසේ ධුර දැරීම අවසන් වන දිනයට පෙරාතුව ම වූ දිනයේ ධුරය දරමින් සිටි සභාපතිවරයා සහ කොමසාරිස්වරුන්, අලුත් සාමාජිකයන් පත් කරනු ලබන තෙක් අඛණ්ඩව ධුර දැරිය යුතු ය.

(5) සිය ධුර කාලය අවසන් වීමෙන් පසු ධුරය හිස් කරනු ලබන සභාපතිවරයා හෝ යම් කොමසාරිස්වරයෙක් හෝ (2) වන උපවගන්තියට යටත්ව නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(6) (අ) ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට හෝ යම් කොමසාරිස්වරයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) සාධාරණ හේතුවක් නොමැතිව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන සභාපතිවරයා හෝ යම් කොමසාරිස්වරයකු,

ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව එම කොමිෂන් සභාවේ රැස්වීමක දී ඇති කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින් සභාපතිවරයා හෝ එම කොමසාරිස්වරයා වෙත නිසි දැනුම්දීමක් සිදු කිරීමෙන් පසු කොමිෂන් සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඇ) ජනාධිපතිවරයා විසින් හේතු දැක්වීමක් නොමැතිව සභාපතිවරයා හෝ යම් කොමසාරිස්වරයකු හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සභාපතිවරයා හෝ යම් කොමසාරිස්වරයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(8) (අ) සභාපතිවරයාගේ හෝ යම් කොමසාරිස්වරයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතුකොටගෙන කොමිෂන් සභාවේ යම් පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගෙන ජනාධිපතිවරයා විසින් එම පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.

(ආ) සභාපතිවරයාගේ හෝ යම් කොමසාරිස්වරයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ඇතිවන පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරනු ලබන යම් තැනැත්තකු විසින් සිය පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(9) රෝගාතුර වීම හෝ වෙනත් අබලතාවකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් තම ධුරයේ කාර්ය ඉටු කිරීමට කොමසාරිස්වරයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකියාවේ හෝ බැහැරව සිටීමේ කාලය තුළ ඔහු වෙනුවට ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ නොහැකියාවට පත් වූ හෝ ශ්‍රී ලංකාවෙන්

බැහැරව සිටින්නා වූ හෝ කොමසාරිස්වරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා වන අවස්ථාවක, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් නැවත සිය කාර්ය ඉටු කිරීම ආරම්භ කරනු ලබන තෙක්, ඔහු වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් යම් කොමසාරිස්වරයකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(10) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ එකී අනුප්‍රමාණවලින් සභාපතිවරයාට සහ කොමසාරිස්වරුන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(11) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනකු සිටිය යුතු අතර, සභාපතිවරයා හෝ සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, කොමසාරිස්වරුන් අතුරින් රැස්වීමේ දී තෝරාපත් කරනු ලබන වෙනත් යම් කොමසාරිස්වරයකු විසින්, කොමිෂන් සභාවේ රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(12) කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ යම් කොමසාරිස්වරයකුගේ පත්වීම පිළිබඳ යම් දෝෂයක් තිබීම පමණක් හේතුකොටගෙන කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1අ) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති, එක් එක් සමථ මණ්ඩල ප්‍රදේශයක් භාරව කටයුතු කරනු ලබන යම් නිලධරයකු සිටිය යුතු ය. එම නිලධරයා විසින්, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති යම් සමථ මණ්ඩල ප්‍රදේශයක්

සඳහා පත් කරන ලද සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් භාරගනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් එම ඉල්ලීම විවෘත කිරීම සඳහා එකී නිලධරයා වෙත ලිඛිතව බලය පවරනු ලබන්නේ නම් මිස, එම නිලධරයා විසින් එකී යම් ඉල්ලීමක් විවෘත නොකළ යුතු ය.

(1ආ) (අ) (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා, 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනතේ විධිවිධාන යටතේ යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයකට පත් කරන ලද සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කර ඇති, (1) වන උපවගන්තියේ සඳහන් ආරාවුලක් සම්බන්ධයෙන් වන ඉල්ලීමක්, සභාපතිවරයා විසින් එසේ තීරණය කරනු ලබන්නේ නම්, මේ පනත යටතේ එම ප්‍රදේශයට ම පත් කරන ලද සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් ඉල්ලීමක්, (1) වන උපවගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "14අ වගන්තියේ සඳහන් නිරවුල් නොකිරීමේ සහතිකයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "12 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් වාර්තාවක් සහ 14අ වගන්තියේ සඳහන් නිරවුල් නොකිරීමේ සහතිකයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 9අ වගන්තිය ඇතුළත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 9අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යඃ-

"යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයකට පත් කරනු ලබන මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීමක් යොමු කිරීම

9අ. (1) 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනතේ 2 වන වගන්තිය යටතේ සිදු කරන ලද නියමයක නිශ්චිතව දක්වා ඇති යම් ආරාවුල් වර්ගයක් යටතට ගැනෙන ආරාවුලකට සම්බන්ධ යම් ඉල්ලීමක්, මේ පනතේ 9 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමථ මණ්ඩලයකට යොමු කර ඇති අවස්ථාවක, එම සමථ මණ්ඩලය විසින් සිය මෙහෙයවීමෙන්, එම ඉල්ලීම 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනතේ විධිවිධාන යටතේ එම ප්‍රදේශයට පත් කරන ලද සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා-

(අ) 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනතේ 4 වන වගන්තිය යටතේ සමථකාරවරුන්ගේ මූල මණ්ඩලය පත් කර නොමැති අවස්ථාවක; හෝ

(ආ) 9 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමථ මණ්ඩලයක් විසින්, එම ප්‍රදේශය සඳහා වන විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයට, 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනතේ විධිවිධාන යටතේ පත් කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත මාස තුනක කාලයක් ඇතුළත ඉල්ලීම යොමු කිරීමට අපොහොසත් වන අවස්ථාවක,

ඒ සම්බන්ධයෙන් වන ලේඛනයක් කොමිෂන් සභාවෙන් ලබා ගැනීමට හෝ මේ උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හෝ එම ඉල්ලුම්කරුට හිමිකම් ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලබා ගනු ලැබූ ලේඛනය, 14අ වගන්තිය යටතේ නිකුත් කරන ලද නිරවුල් නොකිරීමේ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ආරාවුලට සම්බන්ධ පාර්ශ්වයන් විසින්, 9 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමථ මණ්ඩලයේ කටයුතු ආරම්භ කිරීමෙන් නිරවුල් කිරීමකට එළඹීම සඳහා විරෝධය දක්වා නොමැති අවස්ථාවක, (3) වන උපවගන්තියේ සඳහන් නිරවුල් නොකිරීමේ සහතිකයක් හෝ මේ පනත යටතේ සිදු කරනු ලබන කටයුතුවල දී එළඹී නිරවුල් කිරීමක් හෝ 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනත ප්‍රකාරව නිසි සමථකාරවරයන්ගේ මූල මණ්ඩලය වෙත ඉල්ලීම ඉදිරිපත් නොකිරීමේ හේතුව මත පමණක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"නිරවුල් කිරීමක් කළ නොහැකි අවස්ථාවක

12. (1) නිරවුල් නොකිරීම සඳහා වන පහත දැක්වෙන හේතුවලින් යම් හේතුවක් සඳහන් කරමින් 14අ වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, 6 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ නිරවුල් නොකිරීමේ සහතිකයක් සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා විසින් ආරාවුල්කරුවන් වෙත නිකුත් කරනු ලැබිය යුතු ය :-

(අ) නිසි දැනුම් දීමක් සිදු කිරීමෙන් පසු අනුගාමී දින දෙකක් ආරාවුල්කරුවන්ගෙන් එක් අයකු නොපැමිණීම හේතුවෙන් හෝ ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන දින සිට මාස තුනක් ඉකුත්වීමෙන් පසුව හෝ යන කාරණා දෙකෙන් පළමුව සිදුවන්නා වූ කාරණය හේතුවෙන් 9 වන වගන්තිය යටතේ මණ්ඩලයක් පිහිටුවීමට නොහැකි වන්නා වූ අවස්ථාවක; හෝ

(ආ) 9 වන වගන්තිය යටතේ මණ්ඩලයක් පිහිටුවනු ලැබීමෙන් පසු-

(i) ආරාවුල්කරුවන් නිරවුල් කිරීමකට එකඟ නොවන්නා වූ විට;

(ii) නිසි දැනුම්දීමක් සිදු කිරීමෙන් පසු ආරාවුල්කරුවන්ගෙන් එක් අයකු නොපැමිණීම නිසා නිරවුල් කිරීමකට එළඹීමට හැකියාවක් නොමැති විට; හෝ

(iii) ආරාවුල්කරුවන්ගෙන් එක් අයකු විසින්, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන දින සිට මාස තුනක් ගතවීමෙන් පසු 14අ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටින විට.

(2) 7 වන හෝ 8 වන වගන්තිය යටතේ යම් අධිකරණයක් විසින් යොමු කරනු ලබන ආරාවුලක් සම්බන්ධයෙන් වන විට සමථයට පත් කිරීමෙන් ආරාවුල නිරවුල් කිරීමට නොහැකි වූ බව සහ නිරවුල් නොකිරීම සඳහා වූ පහත දැක්වෙන හේතුන්ගෙන් යම් හේතුවක් සඳහන් කරනු ලබමින් සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ වාර්තාවක් සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා විසින් එම අධිකරණය වෙත නිකුත් කරනු ලැබිය යුතු යː-

(අ) නිසි දැනුම්දීමක් සිදු කිරීමෙන් පසු අනුගාමී දින දෙකක් ආරාවුල්කරුවන්ගෙන් එක් අයකු නොපැමිණීම නිසා හෝ ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන දින සිට මාස තුනක් ගතවීමෙන් පසුව හෝ යන කාරණා දෙකෙන් පළමුව සිදුවන්නා වූ කාරණය හේතුවෙන් 9 වන වගන්තිය යටතේ මණ්ඩලයක් පිහිටුවීමට නොහැකි වන්නා වූ අවස්ථාවක; හෝ

(ආ) 9 වන වගන්තිය යටතේ මණ්ඩලයක් පිහිටුවනු ලැබීමෙන් පසු-

(i) ආරාවුල්කරුවන් නිරවුල් කිරීමකට එකඟ නොවන්නා වූ විට හෝ;

(ii) නිසි දැනුම්දීමක් සිදු කිරීමෙන් පසු ආරාවුල්කරුවන්ගෙන් එක් අයකු නොපැමිණීම නිසා නිරවුල් කිරීමකට එළඹිය නොහැකි විට.”.

සැක දුරු කිරීම

7. සැක දුරු කිරීම සඳහා, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දින කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ කොමසාරිස්වරයන් ලෙස ධුර දරනු ලබන තැනැත්තන් විසින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවක් පත් කරනු ලබන තෙක් එම ප්‍රඥප්තිය යටතේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතු අතර, එම කොමිෂන් සභාව පත් කරනු ලබන දින සිට සහ එදිනට පසු සභාපතිවරයා සහ කොමසාරිස්වරයන් ලෙස ධුර දැරීම නතර කළ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.